**සමූපකාර අතිරික්ත අරමුදල - 2017**

**-----------------------------------------**

සමූපකාර අතිරික්ත අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**----------------------**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

**-----------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ, ආදායම් වියදම් ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය ව්‍යාචනය**

**-------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1**

(i) ප්‍රමිතයේ 59 ඡේදය ප්‍රකාරව විශේෂිත හෙළිදරව් කිරීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ මුහුණතෙහි හෙළිදරව් කළ යුතු වුවද, රු.12,652,039 ක් වූ අඩමාන ණය, ආදායම් වියදම් ප්‍රකාශනයේ මුහුණතෙහි දැක්වීමකින් තොරව වෙනත් වියදම් යටතේ ඇතුළත් කර තිබුණි.

(ii) ප්‍රමිතයේ 132 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කළ දේපළ පිරියත හා උපකරණ වල ධාරන අගය, ක්ෂය අනුපාත, ආයෝජන හා ආයෝජන පොලී යනාදිය සම්බන්ධව මිනුම්කරණ පදනම් හෙළිදරව් කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2**

(i) සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහයට බලපෑමක් නොවූ පූර්ව වර්ෂයට අදාලව සමුච්චිත අතිරික්තයට කරන ලද රු. 338,399 ක ගැලපීම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(ii) ප්‍රමිතයේ 40 ඡේදය ප්‍රකාරව රු.127,467,899 ක් වූ ආයෝජන පොළි ලැබීම් ආයෝජන මුදල් ප්‍රවාහයක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වෙනම හෙළිදරව් නොකර මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළ ආදායම් අතිරික්තයෙහි දක්වා තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළදී ස්ථාවර තැන්පතු ආයෝජනයන්හි ශුද්ධ මුදල් ප්‍රවාහය රු.79,100,000 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු.109,401,036 ක් ලෙස දක්වා තිබුණි.

(iv) මුදල් ගලා ඒමක් නොවූ රු.30,432,140 ක් වූ ප්‍රාග්ධනිත කළ ආයෝජන පොළිය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7**

ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් රු.2,720,810 ක් වූ ජංගම නොවන වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් අරමුදල විසින් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල සමුපකාර සමිති ණය පොලි ආදායම රු.35,469,591 ක් වුවද ආදායම් ප්‍රකාශනයේ එය රු.98,776,480 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා ලැබිය යුතු සමුපකාර සමිති ණය පොලී ආදායම රු.63,306,889 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති සමුපකාර සමිති ණය ශේෂය වූ රු.506,924,925 න් වර්ෂය තුල ණය අයවීම් රු.1,690,735 ක් අදාල ණය ගිණුමට බැර කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රයේ ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඇ) අරමුදලේ අඩමාන ණය වෙන්කිරීමේ ප්‍රතිපත්තිය අනුව 2017 දෙසැම්බර් 31 දිනට වූ සමුපකාර සමිති සක්‍රිය ණය ශේෂය මත කළ යුතු ප්‍රතිපාදනය රු.12,526,022 ක් වුවද එදිනට සලසා තිබුණු ප්‍රතිපාදනය රු.81,686,262 ක් වුයෙන් ගිණුම් වල වැඩියෙන් කර තිබුණු ප්‍රතිපාදනය රු.69,160,240 ක් විය.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට විවිධ ණයගැති ශේෂය යටතේ දක්වා තිබුණු සමුපකාර සමිති ණය ශේෂයෙහි මූල්‍ය ප්‍රකාශන අනුව සහ උපලේඛනය අනුව ශේෂයන් අතර රු. 76,776,988 ක වෙනසක් පැවතුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දේපල පිරියත හා උපකරණවලට අදාල අගය සහ උපලේඛන අනුව වූ අගය අතර රු. 184,903 ක වෙනසක් පැවතුණි.

**2.2.4 අවිනිශ්චිත ගිණුම**

---------------------

දිගුකාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින අවිනිශ්චිත ගිණුමේ රු.9,475,735 ක ශේෂයක් ජංගම බැරකම්වල ඇතුලත්ව තිබුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

-------------------------------------

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| i. ලැබිය යුතු සමුපකාර සමිති ණය | 669,008,476 | ශේෂ සනාථ කිරීම් |
| ii. සමුපකාර අරමුදලින් ලැබිය යුතු මුදල | 5,029,486 | |
| iii. පොදු තැන්පත් ගිණුම | 5,500,289 | විස්තරාත්මක උපලේඛනය |
| iv. ස්ථාවර තැන්පත් ඇප ණයහිමියෝ | 58,918,112 | ණය ලිපිගොනු සහ ශේෂ සනාථ කිරීම් |
| v. ඇවර ගිණුම (හර ශේෂය) | 2,620,473 | පිළියෙල කරන ලද ඇවර ගිණුමේ පිටපතක් |
| vi. ගෙවිය යුතු භාණ්ඩාගාර අරමුදල | 150,000 | ශේෂ තහවුරු කිරීම් සහ විස්තරාත්මක උපලේඛන |
| vii. ගෙවිය යුතු ජාතික භාරකාර අරමුදල | 3,871,256 | |
| viii. ක්‍රියාකාරී ගිණුමේ ගැලපීම් | 338,400 | ජ'නල් සටහන් |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අතිරික්ත අරමුදලට ගෙවිය යුතුව පවතින රු.6,017,550 ක් වර්ෂ 05 ක් සිටද, වෙනත් ගෙවිය යුතු වගකීම් ගිණුම් 05 ක ශේෂයන්හි එකතුව රු.1,020,235 ක් වසර 6 කට වැඩි කාලයක සිටද නිරවුල් නොවී තිබුණි.

(ආ) සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය වෙත 1992 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ලබා දී තිබු රු.157,221,330 ක ණය මුදලින් රු.130,398,674 ක්වූ ණය ශේෂ හා ඊට අදාල රු.54,839,436 ක හිඟ පොළිය තවදුරටත් අයවිය යුතුව පැවතුණි. මින් අවස්ථා 5 දී ලබා දුන් රු.107,721,330 ක් වු ණය මුදලින් කිසිදු ණය හෝ පොලී වාරික මුදලක් අය වී නොතිබුණි.

(ඇ) සීමාසහිත කුරුණෑගල ආරෝග්‍යශාලා සමිතිය වෙත නව ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2012 සැප්තැම්බර් 26 දින රු.100,000,000 ක ණය මුදලක් ලබා දී තිබුණි. ණය ගිවිසුම ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දින වන විට රු.18,750,015 ක් අයවිය යුතුව තිබුණද එදින වන විට කිසිදු ණය වාරිකයක් අයවී නොතිබුණු අතර එදිනට හිඟ හිටි පොළිය රු.3,060,164 ක් විය.

(ඈ) 1992 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුල සමුපකාර සමිති 9 ක් වෙත ලබා දී තිබුණු එකතුව රු.184,119,496 ක් වූ ණය මුදලින් 2017 දෙසැම්බර් 31 දින වන විට කිසිදු මුදලක් අය වී නොතිබුණු අතර ඊට අදාළව අයවිය යුතු පොලිය රු. 45,568,282 ක් විය.

(ඉ) සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් භූමියක සුපිරි කිරි වෙළඳසැලක් ඉදිකිරීම සඳහා සි/ස ශ්‍රී ලංකා කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය වෙත 2007 වර්ෂයේදී ලබා දී තිබුණු රු.18,249,750 ක පොළි රහිත ණය මුදලින් රු.16,549,750 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට අයවීමට තිබෙන නමුත් එම සංගමය වර්තමානය වනවිට අක්‍රීය තත්ත්වයේ පවතින බැවින් ණය අයකර ගැනීම අවිනිශ්චිතව පැවතුණි.

(ඊ) සී/ස නිකවැරටිය සංවර්ධන සමුපකාර සමිතියට ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් ඉටුකර ගැනීම සඳහා 2014 ජනවාරි 17 දින රු.4,000,000 ක පොලී රහිත ණය මුදලක් ලබාදී තිබුණි. ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව මාස 03 කින් අවසන් කර ලැබෙන ආදායමින් හෝ සමුපකාර සමිතියට එකතු වන මුදල්වලින් යන දෙකෙන් පළමුව ලැබෙන මුදලින් එකවර ණය මුදල ගෙවා නිදහස් වන බවට ණය ගිවිසුම් ප්‍රකාරව එකඟතාව පළකර තිබුණද 2017 දෙසැම්බර් 31 දිනට රු.1,000,000 ක ණය ශේෂයක් තවදුරටත් අයවිය යුතුව පැවතුණි.

(උ) කොබෙයිගනේ සමුපකාර සමිතියට අයත් ඉන්ධන හලක් නවීකරණය සඳහා 2013 අප්‍රේල් 05 දින ලබා දී තිබුණු රු.10,000,000 ක ණය මුදලින් 2017 දෙසැම්බර් 31 දින වන විට රු.9,166,666 ක් අයවිය යුතු වුවද ඉන් කිසිදු මුදලක් අයවී නොතිබුණි. 2017 දෙසැම්බර් 31 දිනට ඒ සඳහා අයවීමට තිබුණු පොලිය රු.3,564,453 ක් විය. 2014 ඔක්තෝබර් 10 දින නැවත මෙම කාර්යය සඳහා රු.7,000,000 ක ණය මුදලක් ලබා දී තිබුණු අතර මෙම ණය මුදල මාසිකව රු.150,000 ක වාරික වශයෙන් අයවිය යුතු වුවද, 2017 දෙසැම්බර් 31 දින වනවිට රු.5,527,320 ක ණය ශේෂයක් හා රු.972,855 ක පොලියක් අයවීමට පැවතුණි.

(ඌ) සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වර්තමානය වනවිට අක්‍රීය සමිති බවට හඳුනාගෙන ඇති සමුපකාර සමිති 11 ක් වෙත 1990 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වා කාලය තුළ ලබා දී තිබූ ණය මුදල් වලින් 2017 දෙසැම්බර් 31 දිනට එකතුව රු.21,404,358 ක ණය ශේෂයක් හා එකතුව රු.8,261,390 ක පොලී මුදලක් අයවීමට පැවතුනි.

(එ) සී/ස නොච්චියාගම සහ සී/ස හොරොව්පතාන වි.සේ.ස. සමිති ඈවර කර ඇති බව අනාවරණය වී ඇති බැවින් මෙම සමිති දෙක සඳහා ලබා දී තිබුණු ණය මුදල් වලින් 2017 දෙසැම්බර් 31 දිනට අය විය යුතු පිළිවෙලින් රු.241,666 සහ රු.1,000,000 ක් වූ ණය ශේෂ අයකර ගැනීම අවිනිශ්චිත තත්වයක පැවතුනි.

(ඒ) සමාලෝචිත වර්ෂය වනවිට අක්‍රීයව පැවති සී/ස කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතියට ලබා දී තිබුණු රු.14,849,750 ක ණය මුදලක් 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නොවෙනස්ව ඉදිරියට ගෙන එමින් පැවතුනි. සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා විසින් 2015 වර්ෂයේ කෙටුම්පත් විගණකාධිපති වාර්තාවට ලබා දුන් පිළිතුරෙහි“පාසල් සඳහා නොමිලේ කිරිහලක් ලබාදීමේ වැඩසටහන යටතේ ලබාදුන් මෙම මුදල නැවත අයකර ගැනීම සිදුකළ නොහැකි වන අතර, ආධාර මුදලක් නිසා ගිවිසුම් ගත වීමක් සිදු වී නොමැති අතර ගිණුම නිවැරදි කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව”දක්වා තිබුණද, 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල විවිධ ණය ගැතියෝ යටතේ මෙම ණය මුදල දක්වා තිබුණි.

(ඔ) 1999 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.1,721,566 ක අගරු චෙක්පත් ශේෂයක් විවිධ වත්කම් යටතේ පැවතුනි.

(ඕ) විවිධ ණයගැතියෝ යටතේ දක්වා ඇති භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගෙන් ලැබිය යුතු ණය පොලී ලෙස 2000 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.81,871,370 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | 2003 හා 2014 වර්ෂයන්ට අදාල එකතුව රු.106,093 ක් වූ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ |

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 188 (2) | චෙක්පත් 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4: 3 වගන්තිය | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ කාර්යසාධන වාර්තාව සමග සමුච්චිත අරමුදලේ වෙනස්කම් දැක්වෙන ප්‍රකාශයක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිටපතක් සහිතව විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.206,780,520 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.103,997,327 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.102,783,193 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. දෙපාර්තමේන්තු නවීකරණ වියදම් රු. 5,949,591 කින් වැඩි වුවද, පොළී ආදායම රු.107,292,349 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන ලෙස බලපා තිබුණි.
සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අතිරික්තය අඛණ්ඩව වර්ධනය වී තිබුණි. ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී 2013 වර්ෂයේ රු.28,641,018 ක් වූ දායකත්වය 2017 වර්ෂය වන විට රු.179,709,665 දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

සමාලෝචිත වර්ෂයේ අරමුදලේ ආදායම රු.226,244,380 ක් වූ අතර එයින් අරමුදලේ අරමුණු වලින් බැහැරව රු.5,990,957 ක් දෙපාර්තමේන්තු නවීකරණ වියදම් සඳහා වැය කර තිබුණු අතර 1974 ජනවාරි 10 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද රීතිවල 44(iii) වගන්තියේ සඳහන් අරමුදලේ අරමුණු වෙනුවෙන් වැය කර තිබුණේ රු.492,119 ක් පමණි. එමෙන්ම අතිරික්ත මුදල් අරමුදලේ අරමුණුගත කාර්යයන්ගෙන් බැහැරව ස්ථාවර තැන්පතු වල හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ආයෝජන වටිනාකම රු.1,235,903,403 ක් විය.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට සමුපකාර සමිති වෙත රු.773,117,004 ක මුදලක් ණය වශයෙන් ලබා දී තිබුණද මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් පසු විපරම් කටයුතු සිදු කිරීම දුර්වල මට්ටමක පැවතීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට රු.506,924,925 ක් හෙවත් ලබා දුන් ණය මුදලින් සියයට 66 ප්‍රමාණයක් සහ එකතුව රු. 162,083,550 ක පොළී මුදලක් අයවීමට තිබුණි.

(ආ) මානව සම්පත් සමුපකාර සමිතිය ඈවර කිරීමේ කටයුතු වෙනුවෙන් 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා විටින් විට පරිපාලන වියදම්, තීරක ගාස්තු, නීති වියදම්, ගමන් වියදම්, සංග්‍රහ, රැස්වීම්, විගණන කටයුතු සඳහා සහ 2010 වර්ෂයේ තැන්පතු නිදහස් කිරීම සඳහා අරමුදල

විසින් වැයකරන ලද රු.56,901,825 ක් ශේෂ පත්‍රයේ ජංගම වත්කම් යටතේ ලැබිය යුතු ලෙස සටහන් කර තිබුණද, එම සමුපකාර සමිතියේ අවසන් ගිණුම් වාර්තා පදනම් කරගෙන නිවැරදි ශේෂය හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම ඈවර කටයුතු වෙනුවෙන් 2016 හා 2017 වර්ෂයන්වලදී පිළිවෙලින් රු.1,244,081 ක හා රු.472,119 ක මුදලක් වැයකර තිබුණි. සමිතියේ ලියාපදිංචිය 2009 වර්ෂයේදී අවලංගු කර තිබුණද එහි ඈවර කටයුතු විගණන අවස්ථාව වූ 2018 අගෝස්තු වන විටත් අවසන් වී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ බැංකු ජංගම ගිණුමේ අගෝස්තු මස හැර අනෙකුත් සෑම මසකම අවසානයේ රු.මිලියන 4 කට වැඩි ශේෂයක් පවත්වාගෙන ගොස් තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති සමුපකාර සමිති ණය ශේෂය වූ රු.506,924,925 න් දිගුකාලීනව අය නොවන ණය ශේෂයන් වෙනම හඳුනාගැනීමකින් තොරව මුළු ණය සඳහාම සියයට 2.5 බැගින් අඩමාණ ණය ප්‍රතිපාදන සලසා තිබුණි. එමෙන්ම රු.165,373,998 ක් වූ වෙනත් ණය සම්බන්ධයෙන් අඩමාණ ණය වෙන් කිරීමේ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි.

### 4.3 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

1972 අංක 5 දරන සමුපකාර පනතට අදාලව නිකුත් කර ඇති සමුපකාර සමිති රීති 44(iii) ප්‍රකාර සමුපකාර අතිරික්ත අරමුදලින් ණය ලබා දිය හැක්කේ සමුපකාර සමිතිවලට පමණක් වුවද ඊට පටහැනි ලෙස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව වෙත දෙපාර්ශවය විසින් එළඹි ගිවිසුමක් මත 2013 දී රු.75,000,000 ණය මුදලක් ලබා දී තිබුණි. එම ණය මුදලින් 2017 දෙසැම්බර් 31 දිනට රු.62,091,327 හිඟ ණය ශේෂයක් හා රු.25,827,742 ක ණය පොලියක් අයවීමට තිබුණි. ණය ගිවිසුම ප්‍රකාරව, ණය ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ සඳහා ඇප ආවරණ වශයෙන් වත්කම් උගස්කර දෙකකින් අයකර ගැනීමට දෙපාර්ශවය විසින් එකඟ වී තිබුණි.වර්තමානය වන විට ණය අය කර ගැනීමේ කාලය ඉක්මවා තිබුණද, වත්කම් උගස්කරවලින් ණය මුදල් අයකර ගැනීමට අරමුදල විසින් කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ජ'නල් සටහන් පිළියෙල නොකිරීම හා අනුමත නොකිරීම. |
| (ආ) ස්ථාවර වත්කම් | ස්ථාවර වත්කම් ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ණය පාලනය | (i) | සමුපකාර සමිතිවල මුල්‍ය ශක්‍යතාවය පරීක්ෂා නොකිරීම. ණය ලබා දීමේදි ගිවිසුම්වලට එළඹ නොතිබීම හා |
| | | (ii) | ණය අයකර ගැනීමේ දුර්වලතා. |
| | | (iii) | ලබාදුන් ණය පිළිබඳ පසු විපරම් කටයුතු නිසි පරිදි සිදු නොවීම. |